# මුද්දරවලින් හෙළිවන පුරාවිද්‍යාත්මක තොරතුරු

පී. ඩබ්ලිව්. ජී. ලක්මිණි සුපුන්කුමාරි ජයරත්න

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
skysupun@yahoo.com

---

බ්‍රිතාන්‍යයෙන් ඇරඹි මුද්දර එකතු කිරීමේ විනෝදාංශය, වයස් භේදයකින් තොරව ලොව පුරා ජනප්‍රිය විය. වර්තමානය වන විට විනෝදාංශයක් පමණක් නොව දැනුම ගබඩාකර ඇති විශ්වකෝෂයක් ලෙස මුද්දර වැදගත් වේ. ලොව තැපැල් සේවයේ පැවති අවහිරතා මග හරවා ගනු පිණිස භාවිතයට පැමිණි මුද්දර සඳහා යොදා ගනු ලැබුවේ අධිරාජ්‍යවාදී ආකල්ප ඉස්මතු වන පරිදි සමකාලීන රාජ්‍ය පාලකයින්ගේ රූප ආදිය ය. නමුත් වර්තමානය වනවිට එම තත්ත්වය වෙනස් වී සොබා සෞන්දර්යය, අධ්‍යාපන, ආර්ථික, දේශපාලනික, පුරාවිද්‍යාත්මක, ඓතිහාසික ආදී පුළුල් විෂයය ක්ෂේත්‍රයන් නිරූපණය වන පරිදි මුද්දර නිකුත් කර ඇති බව මුද්දර අධ්‍යයනයේදී පැහැදිලි වේ. මෙම පර්යේෂණය සඳහා 1948 ශ්‍රී ලංකාවේ නිදහසින් අනතුරුව වර්තමානය දක්වා නිකුත් වූ මුද්දර පර්යේෂණයට බඳුන් කර ඇත.

මෙම මුද්දර එකිනෙක පර්යේෂණාත්මකව අධ්‍යයනයේදී, මුද්දරයක් සඳහා පුරාවිද්‍යාත්මක ස්ථාන, ස්මාරක, පුරාවස්තු ආදිය යොදාගැනීමට හේතුවී ඇති කරුණු හෙළිදරව් කරගත හැකිය. මෙමගින් ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක ස්ථාන මුද්දරයක් සඳහා භාවිත කර ඇත්තේ කෙසේ ද, කිනම් කාරණයක් වෙනුවෙන් ද, මුද්දරයක් හරහා පුරාවිද්‍යාත්මක තොරතුරු අනාවරණ වන ආකාරය කෙබඳු ද ආදී ගැටලු සඳහා පිළිතුරු ලබාගැනීම අපේක්ෂිත ය. මේ සඳහා මුද්දර පිළිබඳව රචනා වී ඇති කෘතීන් කිහිපයකින් මූලික දැනුම ලබා ගත් අතර අනතුරුව මුද්දර කාර්යාංශය විසින් පවත්වාගෙන යන තැපැල් කෞතුකාගාරයේ ප්‍රදර්ශනය සඳහා තබා ඇති මුද්දර එකතුව හරහා තොරතුරු එකතු කරගනු ලැබිණි. තවද විනෝදාංශයක් ලෙස මුද්දර එකතු කරන පුද්ගලයින් හමු වී ඔවුන්ගේ මුද්දර එකතුන් පරීක්ෂා කර අධ්‍යයනයක නිරත විය. මුල් දින කවර, මුල් දින කවරයේ අන්තර්ගත මුද්දර නිවේදන, සමරු පත්‍ර ආදිය ද පරීක්ෂා කරන ලදී. මෙහිදී හඳුනාගත් දත්ත අතර ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලාංකාවට වැදගත් වන සබඳතා දැක්වීම සඳහා මුද්දර තුළ පුරාවිද්‍යා ස්ථාන අන්තර්ගත කර තිබීම, ලෝක සංචාරක දිනය හා සමගාමීව පුරාවිද්‍යා ස්ථාන අන්තර්ගත කර තිබීම, වෙසක් දින සැමරුම් සඳහා නිකුත් කරන මුද්දරවල බිතුසිතුවම්හි ඡායාරූප අන්තර් ගත කිරීම වැනි කාරණා ප්‍රමුඛ වේ. මුද්දරයක් තුළ අන්තර්ගත පුරාවිද්‍යා ස්ථාන, ස්මාරක හෝ පුරාවස්තු මුද්දරයක් තුළ නිරූපණය කරනුයේ හුදෙක් පුරාවිද්‍යාත්මක අගයෙන් ම නොව අන්තර් ජාතික සබඳතා, සංචාරක ගමනාන්ත, අතීත සිද්ධීන් අනුස්මරණය, ශ්‍රී ලාංකීය අනන්‍යතාවය සංකේතානුසාරයෙන් නිරූපණය සඳහා බව මෙහිදී නිගමනය කෙරිණි.

ප්‍රමුඛ පද : මුද්දර, මුද්දර එකතුන්, සංකේත,